# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 473/9 — 1987 සැප්තැම්බර් 30 බදාදා — 1987.09.30

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත

1985 අංක 7 දරන පනතින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු 48අ වගන්තිය යටතේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලැබූ නියමාවලිය.

එම්. ඩී. ජී.. අබේරත්න,
ලේකම්,
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

1987 ඔක්තෝබර් මස 01 වන දින,
කොළඹ දීය.

#### නියමාවලිය

1. මේ නියමාවලිය, 1987 අංක 03 දරන පශ්චාත් උපාධි අධ්‍යයන පීඨ නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 1987 ඔක්තෝබර් මස 1 වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය. තව ද එය පනතේ 48අ(1) වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ සියලුම පශ්චාත් උපාධි අධ්‍යයන පීඨවලට අදාළ විය යුතු ය.

2. පනතේ සහ යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන වලට යටත්ව, පනතේ 48අ(1) වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ (මෙහි මින්මතු 'පීඨය' යනුවෙන් සඳහන් කරනු ලබන) පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයක්, ඒ ඒ විශ්ව විද්‍යාලය සහ කොමිෂන් සභාව එකඟ වන්නා වූ යම් අධ්‍යයන ක්ෂේත්‍රයක හෝ ක්ෂේත්‍රවල, පර්යේෂණ, ප්‍රවර්ධනය කිරීම සහ උසස් උපාධි ලබාගත හැකි අධ්‍යයන පාඨමාලා හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා පෙලඹීමේ කාර්යය උදෙසා වූ පරිපාලනමය මධ්‍යස්ථානය විය යුතු ය.

3. විශ්ව විද්‍යාලය තුළ කරගෙන යනු ලබන පශ්චාත් උපාධි අධ්‍යයන සහ විශේෂ හෝ බහු විෂයාන්තර පර්යේෂණ සම්බන්ධයෙන් අනුග්‍රහය දැක්වීම, ඒවා සම්බන්ධීකරණය කිරීම සහ විධිමත් කිරීම පීඨයක් විසින් කරනු ලැබිය යුතු අතර අදාළ විශ්ව විද්‍යාලයේ සනාතන සභාවේ විධානයට හා පාලනයට යටත්ව පහත දැක්වෙන කාර්ය සඳහා ද බලය ඊට ඇත්තේ ය:—

(අ) විශ්ව විද්‍යාලවලට අනුබද්ධිත පශ්චාත් උපාධි ආයතනවලට ඇතුළත් කරගනු ලබන ශිෂ්‍යයන් හැර, අනෙකුත් ශිෂ්‍යයන් පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා ඇතුළත් කර ගැනීම;

(ආ) ඇතුල්වීමේ සුදුසුකම්, පාඨමාලාව සඳහා සුදුසුකම්, පාඨමාලාවල විෂය පථය සහ විභාග පටිපාටිය නියම කිරීම;

(ඇ) විශ්ව විද්‍යාලයේ ඉගැන්වීම සහ පර්යේෂණ කටයුතු විධිමත් කිරීම;

(ඈ) විභාග පරීක්ෂකවරයන් වශයෙන් පත් කිරීම සඳහා තැනැත්තන් නිර්දේශ කිරීම;

(ඉ) උසස් උපාධි සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා ශිෂ්‍යයන් නිර්දේශ කිරීම;

(ඊ) පශ්චාත් උපාධි ඉගැන්වීම් හා පර්යේෂණ කට යුතුවල දී අන්තර්-ඒ ඒ පීඨ අතර සහ යම් පීඨයක් තුළ සහයෝගිතාව වැඩි දියුණු කිරීම;

(උ) පර්යේෂණ කටයුතු භාර ගැනීමෙහිලා විද්වතුන් ධෛර්යමත් කිරීම සහ එවැනි පර්යේෂණ කටයුතු හා දැනුම ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සැපයීම; සහ

(ඌ) ශ්‍රී ලංකාවේ සහ ඉන් පිටත පිහිටි වෙනත් පශ්චාත් උපාධි පීඨ සහ පාඨශාලා, පර්යේෂණ ආයතන සහ විශ්ව විද්‍යාල සමඟ සම්බන්ධතා ඇතිකර ගැනීම සහ ඒ සම්බන්ධතා පවත්වා ගෙන යාම.

4. (1) පීඨ සඳහා විශ්ව විද්‍යාලයේ පූර්ණ කාලීන නිලධරයකු විය යුතු පීඨාධිපතිවරයකු සිටිය යුතු අතර ඔහු පීඨයේ ශාස්ත්‍රීය සහ පරිපාලන කටයුතු පිළිබඳ ප්‍රධානයා විය යුතු ය.

(2) පීඨයේ ප්‍රථම පීඨාධිපතිවරයා කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබිය යුතු ය. සෑම තදනන්තර පීඨාධිපතිවරයකුම පශ්චාත් උපාධි අධ්‍යයන මණ්ඩලය විසින් සභාව වෙත නිර්දේශ කරනු ලබන තැනැත්තන් තිදෙනෙකුගෙන් සමන්විත මූල මණ්ඩලයකින් සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය.

(3) පීඨයේ පීඨාධිපතිවරයා ඔහු පත් කරනු ලැබූ දිනයේ සිට ගණන් ගනු ලබන අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර,

(අ) ප්‍රථම පීඨාධිපතිවරයා සම්බන්ධයෙන් වන විට, තත් කාර්ය සඳහා කැඳවනු ලැබූ කොමිෂන් සභාවේ විශේෂ රැස්වීමකදී කොමිෂන් සභාවේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයකින් සම්මත කරගනු ලබන දෝෂාරෝපන යෝජනා සම්මතයක් මගින්, සහ

(ආ) සෑම තදනන්තර පීඨාධිපතිවරයකු සම්බන්ධයෙන් වන විට, තත් කාර්ය සඳහා කැඳවනු ලැබූ සභාවේ විශේෂ රැස්වීමකදී මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයකින් සම්මත කර ගනු ලබන දෝෂාරෝපණ යෝජනා සම්මතයක් මගින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස. ඔහු සුදුස්සකු වන්නේ ය.

(4) පීඨයේ පීඨාධිපතිවරයා වශයෙන් පත් කරනු ලැබූ තැනැත්තකු අවස්ථෝචිත පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානියකු හෝ විශ්ව විද්‍යාලයේ පීඨයක පීඨාධිපතිවරයකු වශයෙන් ධුරය දරමින් සිටියේ නම්, පීඨයේ පීඨාධිපතිවරයා වශයෙන් ඔහු පත් කරනු ලැබූ විට ඔහු විසින් යටකී යම් ධුරයක් දැරීම නතර විය යුතු ය.

(5) රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම, හෝ වෙනත් හේතුවක් නිසා ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට පීඨයේ පීඨාධිපතිවරයා තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක පීඨාධිපති ධුරයේ කාර්ය කරගෙන යාම සඳහා සුදුසුයයි සභාව කල්පනා කරන වැඩ පිළිවෙලක් සභාව විසින් යොදනු ලැබිය යුතුය.

(6) පීඨයේ පීඨාධිපතිවරයා විශ්‍රාම ගත්විට හෝ ඉල්ලා අස්වූ විට නැතහොත් තුන් මාසයක් ඉක්මවන කාලයක් සඳහා ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට ඔහුට නොහැකි වූ විට පීඨාධිපති තනතුර හිස් වූ ලෙස සලකනු ලැබිය යුතු අතර මේ ඡේදයේ (2) වන අනුඡේදයේ විධිවිධානවලට අනුකූලව අලුත් පීඨාධිපතිවරයකු පත් කරනු ලැබිය යුතුය.

(7) ධුරයෙන් ඉල්ලා අස්වන හෝ ඉවත් කරනු ලබන පීඨාධිපතිවරයකු, ඔහු එසේ පීඨාධිපති වශයෙන් පත් කරනු ලැබීමට පෙරාතුව ම යම් උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයේ සාමාජිකයකුව සිටියේ නම් සහ ඔහු වයස අවුරුදු 65 සම්පූර්ණ කොට නොසිටි නම්, ඒ උසස් අධ්‍යාපන ආයතනයේ ඔහු දැරූ ධුරයට ඔහු ආපසු පත් කරනු ලැබිය හැකිය.

5. (1) එක් එක් පීඨයට (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පශ්චාත් උපාධි අධ්‍යයන මණ්ඩලයක් තිබිය යුතු අතර, එය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය.

(අ) මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු පීඨයේ පීඨාධිපතිවරයා ;

(ආ) පීඨය හැර, විශ්ව විද්‍යාලයේ අනෙක් එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා හෝ ඒ පීඨයේ එක් නියෝජිතයෙක් ;

(ඇ) විශ්ව විද්‍යාලයට අනුබද්ධිත පශ්චාත් උපාධි ආයතනවල අධ්‍යක්ෂවරු ;

(ඈ) විශ්ව විද්‍යාලයේ සභාව විසින් නම් කරනු ලබන සාමාජිකයන් තුන් දෙනෙක් ;

(ඉ) විශ්ව විද්‍යාලයේ සනාතන සභාව විසින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙක් ;

(ඊ) පීඨයේ අධ්‍යයන මණ්ඩලවල පශ්චාත් උපාධි තත්වයෙහි වූ ආචාර්යවරයන් අතුරින්, සභාව විසින් කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව නම් කරනු ලබන එක් නියෝජිතයෙක්.

(2) විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරිවරයා හෝ උප කුලපතිවරයා විසින් නම් කරනු ලබන නිලධරයකු හෝ මණ්ඩලයේ ලේකම්වරයා ලෙස කටයුතු කළ යුතු ය.

(3) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණ පූරණය එහි සාමාජික සංඛ්‍යාවෙන් හරි අඩක් විය යුතු ය.

(4) යම් නිශ්චිත කාර්යයක් සඳහා සහ නිශ්චිත කාල සීමාවක් සඳහා එක් තැනැත්තකු හෝ ඊට වැඩි තැනැත්තන් සංඛ්‍යාවක් මණ්ඩලය විසින් අන්තර් ග්‍රහණය කරනු ලැබිය හැකිය. නමුත් එසේ අන්තර් ග්‍රහණය කරනු ලැබූ තැනැත්තකුට මණ්ඩලයේ යම් රැස්වීමක දී ඡන්දය දීමේ අයිතිවාසිකම නොතිබිය යුතු ය.

(5) පීඨයේ පීඨාධිපතිවරයා අමතනු ලැබූ ස්වකීය අත්සන යටතේ වූ ලිපියක් මගින් මණ්ඩලයේ සාමාජිකයකුට ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය : එසේ වුවද ස්වකීය ධුර කාලය ඉකුත් වීමට පෙර යම් සාමාජිකයකු විසින් ස්වකීය ධුරය හිස් කරනු ලැබුවහොත්, ඔහුගේ අනුප්‍රාප්තිකයා විසින්, ඔහු ද කලින් ධුරය හිස් කරතහොත් මිස, තම පූර්වගාමියාගේ ධුර කාලයෙන් ඉකුත් වී නොමැති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(6) සභාපතිවරයා, මණ්ඩලයේ සියලුම රැස්වීම්වල මූලසුන දැරිය යුතු ය. සභාපතිවරයා යම් රැස්වීමකට පැමිණ නොමැති අවස්ථාවක, ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතුරින් තැනැත්තකු ඒ රැස්වීමේ මූලසුන දැරීම සඳහා තෝරා පත්කර ගනු ලැබිය යුතු ය.

(7) අවශ්‍ය කවර හෝ විටක මණ්ඩලය රැස්විය යුතු අතර, කෙසේ වුවද, එක් එක් අවුරුද්දේ දස වාරයකට නොඅඩු වාරයක් මණ්ඩලයේ රැස්වීම් පැවැත්විය යුතු ය.

6. (1) පනතේ සහ යම් උචිත සාධන පත්‍රයක විධි විධානවලට යටත්ව, පීඨයේ ඉගැන්වීම, අධ්‍යාපනය, පර්යේෂණ විභාග පිළිබඳ පාලනය සහ ඒවා සම්බන්ධයෙන් සාමාන්‍ය මෙහෙයවීම සනාතන සභාවේ විධානයන්ට යටත්ව මණ්ඩලය විසින් කළ යුතු ය.

(2) (1) වන අනුඡේදයෙන් මණ්ඩලය වෙත පවරනු ලැබූ බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, මණ්ඩලය විසින් පහත දැක්වෙන බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටු කිරීම සහ කර්තව්‍ය කිරීම කරනු ලැබිය යුතුය :—

(i) පීඨයට අදාළ සියලු කාරණා විධිමත් කිරීම සහ තීරණය කිරීම ;

(ii) පීඨයට ඇතුළත් විෂයවලින් ප්‍රදානය කළයුතු පශ්චාත් උපාධි සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා කවරේද යන්න සහ ඒ උපාධි සහ අනෙකුත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා සඳහා සුදුසුකම් ලැබීමට අපේක්ෂා කරන ශිෂ්‍යයන් විසින් අනුගමනය කළයුතු පාඨමාලා සහ අභ්‍යාස, සමත් විය යුතු විභාග සහ සම්පූර්ණ කළ යුතු වෙනත් කොන්දේසි කවරේද යන්න විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම ;

(iii) රීති සෑදීමට බලය දී ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන් ද ඒ කාරණා සම්බන්ධයෙන් රීති සෑදීම ;

(iv) පීඨයක තත් කාලයෙහි පවත්නා අධ්‍යයන විෂය ක්ෂේත්‍ර ප්‍රතිසංවිධානය කිරීමේ යෝජනා ක්‍රම සනාතන සභාව සහ සභාව වෙත නිර්දේශ කිරීම ;

(v) සනාතන සභාවේ විධානයට හා පාලනයට යටත්ව පීඨයකට ශිෂ්‍යයන් ඇතුළත් කරගැනීම හෝ ලියාපදිංචි කිරීම සඳහා වූ සුදුසුකම් නිශ්චය කිරීම ;

(vi) පශ්චාත් උපාධි සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ප්‍රදානය කරනු ලැබීමට සුදුසු තැනැත්තන්ගේ නම් සනාතන සභාවට නිර්දේශ කිරීම ;

(vii) ශාස්ත්‍රීය උපදේශක කමිටුවක් සහ සුදුසු යයි මණ්ඩලය අදහස් කරනු යම් අනුකමිටු සංඛ්‍යාවක් පත් කිරීම ;

(viii) පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් සනාතන සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම :—

(අ) යම් අධ්‍යාපන අංශයකට අදාළ විෂය මාලා, අධ්‍යයන පාඨමාලා, ඉගැන්වීම සහ පර්යේෂණ ;

(ආ) පශ්චාත් උපාධි සඳහා ඉගැන්වීමේදී සහ පර්යේෂණවලදී අන්තර් විෂය අධ්‍යයන සහ අන්තර් පීඨ සහයෝගය සඳහා පහසුකම් ; සහ

(ix) පීඨයේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි ඉහත සඳහන් බලතලවලට, කාර්යයන්ට හා කර්තව්‍යවලට ආනුෂංගික වූ හෝ නොවූ වෙනත් සියලු ක්‍රියා හා දේ කිරීම.

7. (1) විශ්වවිද්‍යාලය සහ කොමිෂන් සභාව විසින් කලින් කල එකඟ වන ආකාරයට අධ්‍යයන මණ්ඩල යම් සංඛ්‍යාවක් පීඨයට තිබිය යුතු ය :

එසේ වුව ද ආරම්භයේදී පීඨයක පහත දැක්වෙන අධ්‍යයන මණ්ඩල අතුරින් යම් අධ්‍යයන මණ්ඩලයක් හෝ ඒ අධ්‍යයන මණ්ඩල සියල්ලම හෝ තිබිය යුතුය :—

(i) පාංශු විද්‍යා සහ පරිසර අධ්‍යයන

(ii) ඓතිහාසික හා සමාජ අධ්‍යයන

(iii) ආගමික සහ දර්ශන අධ්‍යයන

(iv) භාෂා සහ සංස්කෘතික අධ්‍යයන

(v) සංවර්ධන අධ්‍යයන

(vi) නීති අධ්‍යයන

(2) පීඨාධිපතිවරයාගේ නිර්දේශය මත පර්යේෂණ මහාචාර්යවරයන් සහ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයන් මණ්ඩලය විසින් පත් කරනු ලබන සභාපතිවරයකු එක් එක් අධ්‍යයන මණ්ඩලයට සිටිය යුතු ය.

8. එක් එක් අධ්‍යයන මණ්ඩලය විසින් පහත දැක්වෙන බලතල, කාර්ය සහ කාර්තව්‍ය ක්‍රියාත්මක කිරීම්, ඉටු කිරීම හා කිරීම කළ යුතු ය :—

(අ) මණ්ඩලය විසින් එය වෙත යොමු කරනු ලබන යම් කාරණයක් පිළිබඳව සලකා බලා ඒ සම්බන්ධයෙන් වාර්තා කිරීම ;

(ආ) අධ්‍යයන මණ්ඩලයේ අධ්‍යයන පාඨමාලා, ඉගැන්වීමේ වැඩ සටහනක් හෝ වැඩ සටහන් සහ විභාග යන මේවාට සම්බන්ධ සියලු කාරණා පිළිබඳව නිර්දේශ සහ වාර්තා මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම ;

(ඇ) යම් විශේෂ විෂයක් හෝ විෂයයන් පිළිබඳව සලකා බලා වාර්තා කිරීම සඳහා කමිටු පත් කිරීම ;

(ඈ) අධ්‍යයන පාඨමාලාවලට සහ විභාගවලට ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම සඳහා වූ සුදුසුකම් පිළිබඳව මණ්ඩලය වෙත නිර්දේශ කිරීම ;

(ඉ) ආචාර්යවරයන් සහ විභාග පරීක්ෂකවරයන් වශයෙන් පිළිගනු ලැබීමට සුදුසු තැනැත්තන් මණ්ඩලය වෙත නිර්දේශ කිරීම ;

(ඊ) නියමිත විභාග සමත් වී වෙනත් නියමිත කොන්දේසි සපුරාලීමෙන් පසු පශ්චාත් උපාධි සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ප්‍රදානය කිරීමට සුදුසුකම් ලබා ඇති තැනැත්තන් මණ්ඩලය වෙත නිර්දේශ කිරීම ;

(උ) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ප්‍රදාන, දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව පදක්කම් සහ වෙනත් ත්‍යාග සඳහා සුදුසු තැනැත්තන්ගේ නම් මණ්ඩලය වෙත නිර්දේශ කිරීම ; සහ

(ඌ) තත් කාලයෙහි පවත්නා අධ්‍යයන මණ්ඩල ප්‍රතිසංවිධානය කිරීම සහ අලුත් අධ්‍යයන මණ්ඩල සංවිධාන කිරීම සඳහා යෝජනා ක්‍රම මණ්ඩලය වෙත නිර්දේශ කිරීම.

9. පීඨයේ ස්ථිර ආචාර්ය මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) විශ්ව විද්‍යාලයේ පීඨවල ඇති විශිෂ්ඨ ශාස්ත්‍රීය නිපුණතාවලින් යුත් තැනැත්තන් අතුරින් සභාව විසින් අවුරුදු තුනක කාලයක් සඳහා පත් කරනු ලබන පර්යේෂණ මහාචාර්යවරයන් ;

(ආ) බාහිර තැනැත්තන්ගෙන් සභාව විසින් අවුරුදු දෙකක කාලයක් සඳහා පත් කරනු ලබන ජ්‍යෙෂ්ඨ අධි සම්මාන ශිෂ්‍යයන් ;

(ඇ) සභාව විසින්—

(i) විශ්ව විද්‍යාලයේ පීඨවලින් අවුරුදු තුනක කාලයක් සඳහා පත් කරනු ලබන අධි සම්මාන ශිෂ්‍යයන් ;

(ii) බාහිර තැනැත්තන්ගෙන් අවුරුදු දෙකක කාලයක් සඳහා පත් කරනු ලබන අධි සම්මාන ශිෂ්‍යයන් ;

(ඇ) කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව විශ්වවිද්‍යාලය විසින් පත් කරනු ලබන වෙනත් යම් කාර්ය මණ්ඩල.

10. පීඨයේ ප්‍රථම ආචාර්ය මණ්ඩලය, කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව සභාව විසින් පත් කරනු ලැබිය යුතුය. ඉන් පසුව කරනු ලබන සෑම ආචාර්යවරයන් පත් කිරීමක්ම සභාව විසින් කරනු ලැබිය යුතුය.

11. මේ නියමාවලියෙහි—

"පනත" යන්නෙන් 1985 අංක 7 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනතින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත අදහස් වේ;

"උචිත සාධන පත්‍රය" යන්නෙන්, පනතට අනුකූලව සාදනු ලැබූ යම් නියමයක්, නියමාවලියක්, අතුරු ව්‍යවස්ථාවක් හෝ රීතියක් අදහස් වේ;

"කොමිෂන් සභාව" යන්නෙන්, පනත යටතේ පිහිටුවනු ලැබූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අදහස් වේ;

"අධි සම්මාන ශිෂ්‍යයා" යන්නෙන්, අති විශිෂ්ඨ ශාස්ත්‍රීය නිපුණතාවෙන් යුත් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු හෝ කථිකාචාර්යවරයෙකු අදහස් වේ;

"පර්යේෂණ මහාචාර්යවරයා" යන්නෙන් ස්වකීය අධ්‍යයන ක්ෂේත්‍රයේ පර්යේෂණ කටයුතුවලට සැලකිය යුතු සේවයක් කර ඇති මහාචාර්යවරයෙක්ම හෝ සහායක මහාචාර්යවරයෙක් අදහස් වේ:

"ජ්‍යෙෂ්ඨ අධි සම්මාන ශිෂ්‍යයා" යන්නෙන් අති විශිෂ්ඨ ශාස්ත්‍රීය නිපුණතාවෙන් යුත් මහාචාර්යවරයෙක් හෝ සහායක මහාචාර්යවරයෙක් අදහස් වේ.

10-439

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී